වලිකාමම් නැගෙනහිර සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 30 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිත්‍යාග වශයෙන් සභාවට නිකුත් කරනු ලැබ, සභාව විසින් භාවිතා කරන වාහන දෙක පසුගිය වසර 08 සිට වසර 17 ක කාල පරිච්ඡේදයක් තිස්සේ සභාවට අයත්වී නොතිබුණි. කෙසේවෙතත්, එකතුව රු.2,670,000 ක්වූ ඒවායේ අගය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් වාහන වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව හෝ නිර්දේශිත තක්සේරුකරුවකු විසින් තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දේපළ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
---------------------

මාර්ග නාම පුවරු සැපයීම හා ප්‍රජා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතුව රු.728,341 ක්වූ අත්තිකාරම් අදාළ කාර්යයන් නිම නොකර, දිගින් දිගටම ලැබිය යුතු මුදල් ලෙස පෙන්වා තිබුණි. කෙසේවෙතත් ඊට හේතු විගණනයට ලබා නොදුනි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

ප්‍රජා මධ්‍යස්ථාන පරිත්‍යාග සඳහා විවිධ ණයහිමි ගිණුමේ සලසන ලද රු. 160,000 ක්වූ ප්‍රතිපාදනය අදාළ මධ්‍යස්ථානවලට බේරුම් කර නොතිබුණි. කෙසේවෙතත් ඊට හේතු විගණනයට ලබා නොදුනි.

1.3.4 අනුකූල නොවීම්

---------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ------------------------------- | ------------ | --------------------- |
| | | රු. | |
| (අ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත 140 වගන්තිය | | නව තක්සේරු පැනවීම සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුළවූ එක් එක් නිවාසයේ ගොඩනැගිල්ලේ, ඉඩමේ සහ ගෙවල් සමූහයේ වාර්ෂික වටිනාකම් ප්‍රධාන තක්සේරු කොමසාරිස් අනුමැතිය සමඟ ප්‍රාදේශීය සභාව විසින් අනුමත යම් පුද්ගලයකු හෝ පුද්ගලයන් විසින් තක්සේරු කර නොතිබුණි. |
| (ආ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛය 2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 | 107,500 | නිලධාරීන් 09 දෙනෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.88,557,121 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.67,689,361 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

-----------------------

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 596,560 | 892,747 | 555,195 | 5,388,509 | 599,850 | - | 626,375 | 5,245,770 |
| (ii) කුලී | 18,811,450 | - | 20,774,317 | 329,575 | 14,060,970 | - | 15,475,850 | 329,575 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,968,500 | - | 2,425,256 | - | 1,807,750 | - | 2,069,960 | - |
| (iv)වෙනත් ආදායම් | 53,478,250 | - | 75,150,197 | 33,317 | 49,027,170 | - | 122,950,226 | 33,317 |
| එකතුව | 74,854,760 | 892,747 | 98,904,965 | 5,751,401 | 65,495,740 | - | 141,122,411 | 5,608,662 |

### 2.2.2 වරිපනම් හා බදු

එකතුව රු.5,388,509 වූ දේපළ මත හිඟ තක්සේරු බදු අයකර ගැනීම සඳහා සභාව විසින් පසුගිය වසර 01 සිට වසර 05 කාල පරිච්ඡේදය තුළ අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.3 කුලී

#### වෙළඳ අයිතිය බදු දීම

එකතුව රු. 324,175 ක්වූ හිඟ මස්කඩ බදු කුලී සහ දඩ අයකර ගැනීම සඳහා සභාව විසින් පසුගිය වසර 05 කාල පරිච්ඡේදය තුළ අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

රු.8,082,550 ක් වූ උසාවි දඩ සහ රු. 36,580,526 ක්වූ මුද්දර ගාස්තු උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් 2017 දෙසැම්බර් 31 දිනට දිගින් දිගටම අයවීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### අත්හැර දැමූ කාර්යයන්

සභා අරමුදල් භාවිතා කරමින් වටිනාකම රුපියල් මිලියන 16.9 ක්වූ ප්‍රාග්ධන වැය යෝජනා ක්‍රම දෙකක් සිදු කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී එකී වැඩ යෝජනා ක්‍රම මුළුමනින්ම අත්හැරදමා තිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව මානව සම්පත් විධිමත්ව බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 17 විසින් නිම කළ යුතු කාර්යයන් පමාවී තිබුණි.

(ආ) සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු ගෙන් ආපදා ණය වශයෙන් අයකර ගතයුතු සහ හිඟ වැන්දඹු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් වශයෙන් එකතුව රු.17,062 ක් වසරකට අධික කාලයක් තිස්සේ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්‍ෂමතා
-------------------------
සභාවේ පුත්තූර් උප කාර්යාලයේ දේපළ මත තක්සේරු බදු සඳහා වූ ලේඛනය 1995 වර්ෂයේදී විනාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ දක්වාම ලේඛනය සකස් කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය
-----------------------------
නඩත්තු හා අලුත්වැඩියාවන් සිදුකිරීමට අසමත්වීම
-----------------------------------------------------
වසර 05 කට අධික කාලයක් තිස්සේ ද්වි රෝද ට්‍රැක්ටරයක් අලුත්වැඩියාකර නොතිබුණි. එනිසාම එය දිගින් දිගටම භාවිතා කළ නොහැකිව තිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය
--------------------------------
අයවැය පාලනය
-------------------
අයවැයගත ආදායම් හා තත්‍ය ආදායම් අතර රු.41,365 සිට රු.33,368,956 හෙවත් සියයට 07 සිට සියයට 28 දක්වාත්, අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.2,529 සිට රු.12,176,002 දක්වා හෙවත් සියයට 01 සිට සියයට 21 දක්වා වූ විචලන නිරීක්‍ෂණය විය.

5. පද්ධති හා පාලන
-----------------
විගණනයේදී නිරීක්‍ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
|---|---|
| ගිණුම්කරණය | ඉඩම් විකුණුම මත බදු සඳහා වූ ලේඛනය නඩත්තු කිරීමට අසමත්වීම. |